සබරගමුව පළාත් සභාව - சப்பிரகமுவ மாகாண சபை - Sabaragamuwa Provincial Council

# අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

கல்வி தகவல் தொழில் நுட்பம் மற்றும் கலாசார நடவடிக்கைகளுக்கான அமைச்சு

Ministry Of Education, Information Technology & Cultural Affairs

Email||:edusabaram@gmail.com Facebook||:SabEducationMinistry

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My Number } ME/E/21(සබර/චක්‍රලේඛ) | ඔබේ අංකය / உமது இல / Your Number } | දිනය / திகதி / Date } 2017/01/18 |

**පළාත් අධ්‍යාපන චක්‍රලේඛ අංක**

**සබර/2017/01**

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ,සබරගමුව

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

සියලුම විදුහල්පතිවරු.

## පළාත් රාජ්‍ය සේවයේ නිරත ගුරුවරුන් ජාතික පාසල් හා වෙනත් පාසල් සඳහා නිර්දේශ කිරීම

පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය ගෙන ඇති ප්‍රතිපත්තිමය තීරණ මත හා සියලුම ගුරුභවතුන් වෙත ලබා දී ඇති පත්වීම් ලිපියේ පත්වීම් කොන්දේසියක් ලෙස පත් කරනු ලබන පාසලේ වැඩ භාර ගත් දින සිට වසර 5ක අවම සේවා කාලයක් අනිවාර්යයෙන්ම සේවය කළ යුතු බව සඳහන්ව ඇත.

02 එහෙත් බොහෝ විදුහල්පතිවරුන් මෙම නියෝග හා උපදෙස් උල්ලංඝනය කරමින් සේවා කාලය වසර 5ට අඩු ගුරුවරුන් පහත හේතු සඳහන් කරමින් පාසලෙන් නිදහස් කිරීම නිර්දේශ කර එවනු ලැබේ.

01. අදාල ගුරුභවතුන් පාසලට අතිරික්ත බව සඳහන් කිරීම
02. සමහර විෂයන් සඳහා පුරප්පාඩු නොමැති බව සඳහන් කිරීම
03. සමහර විෂයන් පාසලේ ආරම්භ කර නොමැති බව සඳහන් කිරීම
04. පාසලේ අදාල විෂය ඉගෙනීම සඳහා ප්‍රමාණවත් සිසුන් සංඛ්‍යාවක් නොමැති වීම.

ඉහත හේතු දක්වමින් කොට්ඨාස හෝ කලාප අධ්‍යක්ෂවරුන්ගේ නිර්දේශයක් නොමැතිව සෘජුවම අමාත්‍යාංශය වෙත මෙම ඉල්ලීම් ඉදිරිපත් කරනු ලබයි.එබැවින් මෙලෙස නිදහස් කිරීම නිර්දේශ නොකරන ලෙස දන්වන අතර පහත සඳහන් උපදෙස් තරයේ පිළිපදින ලෙස මෙයින් අවධාරණය කරමි.


...ා අමාත්‍යතුමා ...ion.Minister Office-045-5623222,045-2287306 Residence-045-2222538 Mobile-077-9102001 Fax-045-2228042

අමාත්‍යාංශ ලේකම් Secretary Office-045-2223015 Residence-045-2232985 Mobile-071-4402000 email-msweerasooriya@gmail.com

කාර්යාලය Office නවනගරය,රත්නපුර. Newtown,Rathnapura. Office-045-2222542 Fax-045-2228042

03 යම් හෙයකින් යම් විෂයක් සඳහා අවම සේවා කාලය සම්පූර්ණ නොකළ ගුරුවරු සිටින අවස්ථාවක තවත් ගුරුවරයෙක් එම විෂයටම පාසලට පත් කර එවා ඇත්නම් එම අය සඳහා රාජකාරි භාර නොදී කලාප කාර්යාලය හෝ අමාත්‍යාංශය වෙත යොමු කළ යුතුය. එමෙන්ම සේවා කාලය වසර 5ට අඩු ගුරුභවතුන් තම පාසලේ යම් විෂයකට අතිරික්ත වන්නේ නම් විදුහල්පති විසින් ඒ ගුරුභවතුන්ට පළාතින් පිටතට හෝ ජාතික පාසල් සඳහා නිර්දේශ නොකර ඒ බව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් මා වෙත දැන්වීමට කටයුතු කළ යුතුය. මන්ද එම පාසලේ එම විෂයට ගුරුවරු අතිරික්ත වුවද කලාපය තුළ හෝ පළාත තුළ එම විෂයට ගුරු හිඟය සහිත පාසල් තිබිය හැකිය.

04 තවමත් මෙම පළාතේ එක් එක් විෂයන් සඳහා විෂයානුබද්ධව ගුරු හිඟයක් පවතින බැවින් සේවා කාලය වසර 5ට අඩු ගුරුභවතුන් පළාත තුළ රඳවා ගැනීම අනිවාර්ය වේ. තවද මෙම ගුරුවරුන් බඳවා ගැනීම, පුහුණු කිරීම සඳහා විශාල මුදලක් පළාත් සභාව විසින් දරා ඇත. එම තත්ත්වය තුළ පත්වීම් කොන්දේසි ප්‍රකාරව නියමිත කාලය පාසලේ හෝ කලාපය තුළ හෝ පළාත තුළ හෝ සේවය නොකර නිදහස් කිරීම විගණන විමසුම්වලට ද භාජනය විය හැකි කරුණකි.

05 මෙම ලිපියේ උපදෙස් තරයේ පිළිපදින ලෙස අවධාරණය කරමි.

Ministry of Provincial Education
Sabaragamuwa

මහින්ද එස්.වීරසූරිය
ලේකම්
අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
සබරගමුව පළාත් සභාව

මහින්ද එස්. වීරසූරිය
ලේකම්
අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
සබරගමුව පළාත් සභාව,
නව නගරය - රත්නපුර.

පිටපත: E/3, E/4 විෂය